කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) - 2021/2022

**PSC 4171 – ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති සහ පරිපාලනය**

කාලය : පැය දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය විස්සකි (20).

---

01. සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳපළ පද්ධතියේ මූලික ව්‍යුහය වෙනස් කිරීම කෙරෙහි ගෝලීයකරණ ක්‍රියාවලියේ බලපෑම 1980 දශකයේ සිට ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඇසුරින් පැහැදිලි කරන්න.

02. අ). ව්‍යුහාත්මක ගැළපුම් වැඩසටහනේ (Structural Adjustment Programme) මූලික ලක්ෂණ හඳුනා ගන්න.

ආ). බ්‍රෙටන්වුඩ් ආයතන (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) හා ලෝක බැංකුව (WB) විසින් ශ්‍රී ලංකාවට මූල්‍ය ආධාර ලබා දීම වෙනුවෙන් ඉදිරිපත් කොට ඇති නවතම පූර්ව කොන්දේසි පැහැදිලි කරන්න.

03. වාර්ගික සුළුතරයන්ගේ ගැටළු විසඳීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ බලය බෙදීම සඳහා අනුගමනය කළ පහත ප්‍රයත්න පරීක්ෂා කරන්න.

අ). දිස්ත්‍රික් සංවර්ධන සභා – 1980 (District Development Council)

ආ). පළාත් සභා – 1987 (Provincial Councils)

04. ශ්‍රී ලංකාවේ අනුප්‍රාප්තික ආණ්ඩුවල රාජ්‍ය ප්‍රතිපත්ති දකුණේ සිංහල තරුණයන්ගේ දේශපාලන හා ආර්ථික අභිලාෂ ඉටු නොකළ බව ඔබ සිතන්නේ ද? ජනතා විමුක්ති පෙරමුණේ 1971 සහ 1988-89 කැරලිවල අත්දැකීම් ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

05. "නිදහසේ ලැබූ දා සිට ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දෙන ලද වෙනස් කොට සැලකීමේ ප්‍රතිපත්ති, රටේ උතුරු-නැගෙනහිර කලාපයේ දෙමළ තරුණයන් විසින් ආයුධ අතට ගෙන වෙනම රාජ්‍යයක් නිර්මාණය කිරීම සඳහා අරගල කිරීමට හේතු විය." දශකයක් පුරා රටතුළ පැවැති සිවිල් යුද්ධයට මූලික වූ හේතු පිළිබඳ සුදුසු උදාහරණ සහිතව ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

06. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

ඇ). 1972 රාජ්‍ය පරිපාලනය මත දේශපාලන මෙහෙයවීම

ආ). 1978 විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන බලපෑම්

ඇ). ආර්ථික අර්බුදය පිළිබඳ 2022 ජනතා අරගලය

ඈ). ශ්‍රී ලංකාවේ පෞද්ගලිකරණ ක්‍රියාවලිය සහ සුභසාධන රාජ්‍යයේ බිඳවැටීම

****************************